# තුරුසවිය අරමුදල

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට තුරුසවිය අරමුදලේ මල්‍යා තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2011 දිනට පොත් අගය මත රු. 635,902 කට තොගය ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තුරුසවිය සමිති වෙතන් අරමුදලට අයවිය යුතු , එකතුව රු.1,445,796 ක වූ ණය මුදල් වර්ෂ 5 කට වැඩි කාලසීමාවක සිට අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම අයවිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) අරමුදල කලින් පවත්තාගෙන ගොස් තිබුණු කාර්යාලයට ගෙවිය යුතු රු.23,574 ක් වූ විදුලි බිල නිරවුල් කිරීමකින් තොරව දිගින් දිගටම ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

1.2.3 නීති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

2000 අංක 23 දරන තුරුසවිය අරමුදල් පනතෙ 17 (4) වගන්තිය ප්‍රකාර තුරුසවිය සමිති, ලියාපදිංචි කිරමේදීත්, අවලංගු කිරමේදීත් ඒ බව සඳහන් නිවේදන ගැසට් පත්‍රයේ පලකල යුතු වුවද දැනට ලියාපදිංචි කර ඇති සමිති 663 න් සමිති 370 ක් වෙනුවෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය භාණ්ඩාගාරයෙන් ලද රු.11,786,774 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.3,293,692 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද රු.10,338,033 ක පදාන ගණන් ගැනීමෙන් පසු රු.1,389,864 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,903,828 ක පිරිහීමක් පෙන්නුම් කෙරණ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ආදායම රු.12,397,237 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ආදායම වූ රු.10,926,990 සමඟ සැසඳීමේ දී 13% ක වර්ධනයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මෙහෙයුම් වියදම රු.15,690,929 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම වූ රු.12,316,854 සමඟ සැසඳීමේ දී 27% ක වැඩි වීමක් විය.

(ඇ) ආදායම වැඩිවීමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් වියදම වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඌනතාවය 137% කින් වැඩිවී තිබුණි.

2.3 වියදම් වල වැඩි වීම සහ ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල නව ගොඩනැගිල්ලකට පිවිසීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලිය 476% කින් වැඩි වී තිබුණි.

(ආ) අරමුදලෙ අඛණ්ඩ මෙහෙයුම් ආදායම් ඉක්මවා ගිය වියදම් තත්ත්වයක් පැවතීම හේතුවෙන් වාර්ෂිකව ශුද්ධ වත්කම්හි බාදනය වීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ අරමුදලේ රු.7,825,245 ක් වූ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.5,784,436 ක් වූයෙන් එය 26% කන් අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදලෙහි සමිති ලියාපදිංචි කිරීමේ ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට, තුරුසවිය සමිති 663 ක් ලියාපදිංචි කර තිබුණි. 2010 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීය සමිති සම්බන්ධයෙන් අරමදලට වාර්තා වී නොමැති බව දන්වා තිබුණද බොහොමයක් සමිති අක්‍රිය තත්ත්වයේ පවතින බවත් සමිති මගින් සාමාජිකයින්ට ඉටු කෙරෙන කාර්යයභාරය කුමක්ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් ඔවුන් අතර නොමැති සමිති පවා තිබූ බවත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී අළුතින් ලියාපදිංචි කර තිබුණේ සමිති 5 ක් පමණි.

(ආ) සමිති විසින් ත්‍රෛයිමාසික වාර්තා ඉදිරිපත් කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, ලියාපදිංචි කරන ලද සමිති 663 න් සමිති 638 ක් 2011 වසර සඳහා අර්ධ වාර්ෂික වාර්තා පවා එවා නොතිබුණි.

(ඇ) 2011 වර්ෂය සඳහා රු.15,690,929 ක් වූ අරමුදලේ සමස්ථ වියදමෙන් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණේ රු.5,493,790 ක් පමණි. එය සමස්ථ වියදමෙන් 35% ක ප්‍රතිශතයක් විය.

(ඇ) 2011 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත රු.15,659,500 ක් වූ වියදම මූල්‍යනය කිරීම සඳහා අරමුදල විසින් රු.2,979,500 ක ස්වකීය ආදායමක් රැස්කිරීමට බලාපොරොත්තු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්කර තිබුණේ ඉන් රු.484,996 ක් හෙවත් 16% ක ආදායමක් පමණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

තුරුසවිය අරමුදල මගින් සාමාජිකයින්ගෙන් අයකර ගනු ලබන සාමාජික මුදල් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂයේ සාමාජික අරමුදල් ආදායම, ලැබියයුතු සාමාජික අරමුදල් සහ වර්ෂය තුළ මුදලින් ලැබීම් ගිණුම් ගත කිරීම සඳහා සාමාජික අරමුදල් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) සාමාජික මුදලින් අරමුදලට බැර කරනු ලබන 50% ක මුදල සඳහා වෙනම අරමුදලක් ගොඩනගා, එම එකතු වන මුදලින් සාමාජිකයින්ට ප්‍රතිලාභ සැලසිය හැකි විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම වෙනුවට එකතුවන සමාජික මුදල අරමුදලේ සාමාන්‍ය බැංකු ගිණුමට බැර කර ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ අනුව සාමාජිකයින්ගෙන් එකතු කරගනු ලබන මදල් සඳහා නිසි පාලනයක් නොමැති වීම හේතුවෙන් එම මුදල් පවා අරමුදලේ පුනරාවර්ථන වියදම් සඳහා ද වැය විය හැකි බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) ඉහත පරිදි එකතු කරගනු ලබන සාමාජික මුදලින් සාමාජිකයින්ට ප්‍රතිලාභ සැලසිය හැකි විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා නොතිබීම හේතුවෙන් අරමුදලට මුදල් බැරකිරීම සඳහා ගන්නා ලද තීරණය බොහොමයක් තුරුසවිය සමිති මගින් ක්‍රියාත්මක නොකරන බව කෑගල්ල ප්‍රදේශයේ සිදු කරන ලද චාරක පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

3.3 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වෙනුවෙන රජය විසින් රු. 6,292,984 ක් අරමුදල වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රදාන ලබා ගැනීමේදී අරමුදල විසින් 2011 ජනවාරි 01 දිනට ආයෝජනය කර තිබුණු රු.3,895,620 ක් වූ මුදල් භාණ්ඩාගාරයට අනාවරණය කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මෙම ආයෝජනයෙහි වටිනාකම රු. 4,151,268 ක් විය.

3.4 ආර්ථික නොවුන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල විසින් සිය කාර්යාලය පවත්වාගෙන ගිය ස්ථානය සඳහා මෙතෙක් ගෙවූ මාසික ගොඩනැගිලි කුලිය රු.28,539 ක් වූ අතර එය එම ගොඩනැගිල්ලේම වෙනත් සථානයකට ගෙන යෑම නිසා මාසික කුලිය ලෙස රු.108,436 ක් ගෙවීමට සිදු වී තිබුණි. මේ අනුව වසරකට රු.958,775 ක අනාර්ථික වියදමක් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රබර් පර්යේෂණ ආයතනය විසින් 2008 වසරේ මිලදී ගෙන තිබූ කිරිපිහි 743 න් කිරිපිහි 575 ක් අනුමත ගුණාත්මකභාවය නොමැතිවීම හේතුවෙන 2011 දෙසැම්බර් 31 වන විටත් ගබඩාවේ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි. එහෙයින් ඒ සඳහා දරන ලද රු.330,625 ක් වූ වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් 27% සිට 91% දක්වා අයවැයගත වියදම ඉක්මවා තත්‍ය වියදම් දැර්මක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) තොග පාලනය

(ආ) ගෙවීම් වවුචර් පිළියෙල කිරීම

(ඇ) තුරුසවිය සමිති ලියාපදිංචි කිරීම.